# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී - III ශ්‍රේණිය (දෙපාර්තමේන්තුමය)තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2021

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් මහනගර සභාවල පුරප්පාඩුව පවතින නීති නිලධාරී - III ශ්‍රේණිය (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2021.08.06** දින වේ.

**කල්මුණේ මහනගර සභාව - පුරප්පාඩු 01**
**මඩකලපුව මහනගර සභාව - පුරප්පාඩු 01**

**2. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි :-**

**2.1.** මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

**2.2.** මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

**2.3.** මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු දහයක (10) අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුවේ.

**2.4.** ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති දැනටමත් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවා නියුක්ත වූවන් ඔවුනගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේම අයදුම්කරු මෙම තනතුර සඳහා තේරී පත්වුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟතාවය පළ කල යුතුය. මෙම තනතුර සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය නොමැතිව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවෙකු තෝරා ගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**3. යෝග්‍යතා ඃ-**

**3.1. සාමාන්‍ය සුදුසුකම්**

**3.1.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

**3.1.2.** යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
**2021.08.06** වන දිනට වයස අවුරුදු **21** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සිටින අය හට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**3.1.3.** දීපව්‍යාප්තව මෙම තනතුර සඳහා අයදුම්පත් යොමුකළ හැකිය. එසේ වුවත් නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්හට බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවය හිමි වේ.

**3.2. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් ඃ-**

**3.2.1.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.
**සහ**

**3.2.2.** ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා ඇති අයදුම්කරුවෙකු වීම.

**3.3. පළපුරුද්ද ඃ-**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව වසර එකකට (01) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**සැලකිය යුතුයි - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021.08.06 වන දිනට හෝ ඊදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**4. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**4.1.** නැගෙනහිර පළාත් සභාව සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට, රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබේ. අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා, මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ.

**4.2.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතාවයේ අනු පිළිවෙල මත පවතින පුරප්පාඩු දෙක (02) සඳහා බඳවා ගනු ලැබේ.

**4.3.** සෑම අයදුම්කරුවකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාල පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**4.4.** සම්මුඛ පරීක්ෂණයේදී බඳවාගැනීමේ සුදුසුකම් සනාථ කරන අයදුම්කරුවන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි - III ශ්‍රේණියට (දෙපාර්තමේන්තුමය) බඳවා ගනු ලැබේ. මෙම තනතුරට 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක ඃ 03/2016 අනුව **SL 1-2016** දරණ වැටුප් බණ්ඩය යටතේ මාසිකව **රු. 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 74,005/-** වැටුප් පරිමාණයක් හිමි වේ.

**5. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

**5.1.** මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 4.2 දක්වා පළමු පිටුවටද, අංක 4.3 සිට 11.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

**5.2. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**5.3.** අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080.00 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. **රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

**5.4.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021.08.06** වන දිනට හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. **(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංක: 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය

**5.5.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **EX/Rec/21/08 "පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම** " ලෙස සඳහන් කළ යුතුය.

**5.6.** මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට කැඳවීම් ලිපියක් යොමු කරනු ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට කැඳවීම් ලිපියක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**6. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**7. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වනු ලැබේ.**

**8. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

**8.1.** අයදුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව, යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

**9.** මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී ඒ සඳහා පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**10. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන ආකාරය පහත දැක්වේ ඃ-**

| **ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ** | **උපරිම ලකුණු** |
|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 02. අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 |
| 03. අතිරේක පළපුරුද්ද<br>නීතිඥයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ ලබාඇති පළපුරුද්ද සඳහා සම්පූර්ණ වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30 කි. (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා නීතිඥයෙකු ලෙස සේවය කළ වසර 01 ක කාලය හැර) | 30 |
| 04. පරිගණක සාක්ෂරතාවය | 15 |
| 05. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය | 15 |
| 06. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| **මුළු ලකුණු** | **100** |

**11.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**12.** මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ / නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ උපදෙස් මත නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතු වේ.

එම්.වයි.සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
2021.07.13

**EX/Rec/21/08**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

**<u>නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>**
**<u>නීති නිලධාරී - III ශ්‍රේණිය (දෙපාර්තමේන්තුමය)තනතුරට බඳවා ගැනීම සඳහා වන</u>**
**<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2021</u>**

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ..........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : Mr. PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................

1.3 සම්පූර්ණ නම : ..........................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..........................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M ☐
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ..........................................

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ..........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................

2.2 ස්ථිර ලිපිනය : ..........................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..........................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................

**3.0** 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 **2021.08.06** දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** අධ්‍යාපන සුදුසුකම්

4.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ..........................................
(ii) විභාග අංකය : ..........................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ..........................................
(ii) විභාග අංකය : ..........................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

4.3. අයදුම්කරු ලබා ඇති නීති උපාධිය පිළිබඳ විස්තර ,

i. විශ්ව විද්‍යාලය ඃ- .....................................................................
ii. උපාධිය ඃ-.......................................................................
iii. උපාධි සහතිකය වලංගු වන දිනය ඃ- .....................................................................

**5.0** වෘත්තීය සුදුසුකම් ඃ-
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ
නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය ඃ- ..................................................................

**6.0** අයදුම්කරු ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර

6.1 ආයතනය : .....................................................................
6.2 කාලසීමාව : .....................................................................

**7.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : .....................................................................

**8.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

8.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : .....................................................................
8.2 වර්තමාන තනතුර : .....................................................................
8.3 මුල්පත්වීම් දිනය : .....................................................................
8.4 වර්තමාන තනතුරෙහි ස්ථිර කළ දිනය : .....................................................................

**9.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ...............................  ..................................
අයදුම්කරුගේ අත්සන

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 5.3 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

...........................................
අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ...............................
සහතික කරන්නාගේ නම : ...............................
තනතුර : ...............................
ලිපිනය : ...............................
*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

**11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(රජයේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියකු වශයෙන් සේවය කරන.......................................මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට සිටින සේවයෙන් නිදහස් කල හැකි බවත් ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ...................................................................
නම : ...................................................................
තනතුර : ...................................................................
ලිපිනය : ...................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)